

# ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාවේ ආර්ථික සහ අන්‍ය සබඳතාවල අනාගතය ...

**ට්‍රිලියන 1.2 ක දළ දේශීය නිෂ්පාදිතයක් හා බිලියන 1.1 ක ජනතාවක්: අපි ඉන්දියාව හා කෙසේ පෑහෙමු ද?**

ආචාර්ය රොහාන් සමරජීව සහ ප්‍රියංවදා හේරත්

**හැඳින්වීම**

ඉන්දියාව වූ කලී, ශ්‍රී ලංකාව සමඟ දැඩි සම්බන්ධතා පවතින ලොව ප්‍රබල ආර්ථිකයන් ගෙන් එකකි. එය මෙරට සතු ආකර්ෂණීය වෙළෙඳ පොළක් ද වෙයි. අපගේ ඓතිහාසික තත්ත්වයන් මෙන්ම ළංව පිහිටීම ද මෙකී දැඩි සම්බන්ධතාවට හේතු වන්නේය. ඉන්දියාව අප රට සමඟ පවත්වන්නේ බොහෝ දුරට මිත්‍රශීලී සම්බන්ධතාවක් වන අතර එය සිය ක්ෂුද්‍ර නොවන මට්ටමේ අසල්වැසියන් සමඟ ඉන්දියාව පවත්වන හොඳම සම්බන්ධතාවද විය හැකි ය. ස්වකීය ප්‍රථම ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම (FTA) ඉන්දියාව ඇති කර ගත්තේ ශ්‍රී ලංකාව සමඟ ය. වෙළෙඳාම ද ආයෝජනයන් ද යන අංශයන් තුළ සැලකිය යුතු වර්ධනයකට හේතු වී තිබෙන මෙම ගිවිසුම යම් යම් කරුණු සම්බන්ධයෙන් මත භේදයනට තුඩු දුන් අවස්ථාවන් තුබුණු නමුදු, එමගින් බොහෝ ගැටලු සඳහා විසඳුම් ද ඉදිරිපත් කරනු ලැබ තිබේ. 2008 වර්ෂයේ අවසාන කාර්තුව තුළ දී ශ්‍රී ලංකාවෙහි වෙනත් අපනයන වෙළෙඳපොළවල් තුළ ඍණාත්මක තත්ත්වයක් දක්නට තිබිය දී සියයට 5.3 කින් වර්ධනය වුණු ඉන්දියාව 2009 තුළ දී සියයට 7 ක වර්ධනයක් ලබනු ඇතැයි අපේක්ෂා කැරෙන අතරම ලෝක ආර්ථික අර්බුදයෙහි අඩු ම බලපෑම ලද රටවල් ගණයට ඇතුළත් විය හැකි බව ද පෙනෙන්නට තිබේ. භාණ්ඩ වෙළෙඳාම හා සම්බන්ධව වර්තමානයෙහි පවත්නා යහපත් ද්විපාර්ශ්වික පදනම තව දුරට වර්ධනය කර ගැනීමෙන් දෙරටට ම මහඟු ප්‍රතිලාභ අත් කරගත හැකි වනු ඇති බව මේ අනුව පෙනී යයි. ප්‍රමාණික (economies of scale) පිරිමැසුම් අත් කර ගැනීමෙහි ද, තිරසාර වූ අඩු පිරිවැය වටිනාකම්දාමය හා සම්බන්ධ වීමෙහි ද එසේ ම විශාල ආයෝජනයන් හි යෙදීමෙහි ද හැකියාව සහිත සුවිශාල වෙළෙඳපොළක් වෙතින් ලද හැකි වාසි මෙහි දී ශ්‍රී ලංකාවට ලබා ගත හැකි වන්නේ ය. මේ ආකාරයෙන් ඇති වන්නා වූ ප්‍රබල කලාපීය වර්ධනය ද දේශපාලන මතගැටුම් අවම කර ගැනීමට හැකි වීම ද හේතු කොටගෙන අසල්වැසි රටක් සමඟ ඵලදායී සම්බන්ධතා ගොඩ නඟාගත් රටක් ලෙස නැඟී සිටීමට හැකි වීමේ වාසිය ඉන්දියාවට අත් කරගත හැකි වන්නේ ය.

**භාණ්ඩ වෙළෙඳාම**

1990 දශකයේ දී විශේෂයෙන්ම ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් අනතුරුව ශ්‍රී ලංකාවෙහි භාණ්ඩ වෙළෙඳ රටාව වෙනස් වූයේ ය. ශ්‍රී ලංකාව ඉන්දියාව වෙත කළ අපනයනයන්ගේ වටිනාකම 2007 වනවිට එ.ජ.ඩොලර් මිලියන 515.3 දක්වා ඉහළ ගියේ ය. සියයට 47.5 ක් වූ සමස්ත අපනයන වර්ධනය හා සැසඳීමෙහි දී එය සියයට 838 ක වර්ධනයකි. (1 වැනි වගුව) 2007 වර්ෂයේ දී ඉන්දියාව ශ්‍රී ලංකාවෙහි තෙවන විශාලතම අපනයන දේශය බවට පත්ව තිබිණි.

1 වැනි වගුව : ශ්‍රී ලංකාවෙහි අපනයන දේශයන් : 2007 හි පැවැති ඉහළ ම රටවල් 5

| රට | 2000 එ.ජ.ඩො.මිලියන | 2007 එ.ජ.ඩො.මිලියන | වෙනසෙහි % |
|---|---|---|---|
| අ.එ.ජනපදය | 2,075 | 1,970 | -5.1 |
| එ.රාජධානිය | 697 | 1,018 | 46.0 |
| ඉන්දියාව | 55 | 515.3 | 838.0 |
| ජර්මනිය | 218 | 437.9 | 101.0 |
| බෙල්ජියම | 147 | 400.1 | 171.3 |
| මුළු අපනයන | 5,248 | 7,740 | 47.5 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන : 2000 දී පැවැති ඉහළ ම රටවල් නොවේ. 2000 වර්ෂයේ මෙම දත්ත ඉදිරිපත් කරනු ලැබ තිබෙන්නේ සංසන්දනය පිණිස පමණි.

ශ්‍රී ලංකාව, ඉන්දියාවෙන් කරන ලද ආනයනයන් ද 2007 වර්ෂයේ දී එ.ජ.ඩොලර් 2,610 ක් බවට පත් වෙමින් ශීඝ්‍ර වර්ධනයක් ප්‍රදර්ශනය කළේ ය. (2 වැනි වගුව) 2000-2007 වකවානුවේ දී සමස්ත ආනයන වර්ධනයේ ප්‍රතිශතය 63.2 ක් වූ අතර ඉන්දියාව වෙතින් කරන ලද ආනයන වර්ධන ප්‍රතිශතය 359.5 ක් වුයේ ය. 1997 වර්ෂයෙන් මෙපිට ශ්‍රී ලංකාවෙහි විශාලතම ආනයන මූලය වුයේ ඉන්දියාවයි.

1 වැනි වගුව : ශ්‍රී ලංකාවෙහි අපනයන දේශයන් : 2007 හි පැවැති ඉහළ ම රටවල් 5

| රට | 2000 එ.ජ.ඩො.මිලියන | 2007 එ.ජ.ඩො.මිලියන | වෙනසෙහි % |
|---|---|---|---|
| ඉන්දියාව | 568 | 2,610 | 359.5 |
| සිංගප්පූරුව | 469 | 1,119 | 138.2 |
| චීනය | 370 | 924 | 150.0 |
| ඉරානය | 192 | 844 | 338.2 |
| හොංකොං | 488 | 725 | 48.4 |
| මුළු ආනයන | 6,923 | 11,301 | 63.2 |


මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන : 2000 දී පැවැති ඉහළ ම රටවල් නොවේ. 2000 වර්ෂයේ මෙම දත්ත ඉදිරිපත් කරනු ලැබ තිබෙන්නේ සංසන්දනය පිණිස පමණි.

වෙළෙඳ කටයුතුවල දී ප්‍රසාරණයක් සිදු වීමට නම් බාධාවන්ගෙන් තොරව කටයුතු සිදු වීමේ පරිසරයක් ගනුදෙනුවට සම්බන්ධ වන දෙපාර්ශ්වය ම විසින් නිර්මාණය කළ යුතු ය. ඉන්දියානු වෙළෙඳ ප්‍රතිපත්තියෙහි සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් ගෙන් පසුව 1990 දශකය තුළ දී මෙම අවශ්‍යතාව සතුටුදායක මට්ටමකින් සම්පූර්ණ වුයේ ය. කෙසේ වුව ද වෙළෙඳ ප්‍රසාරණයන්හි ලා ගැම්මක් ඇති වූයේ ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් හේතු කොටගෙන ය. 1997 දකුණු ආසියානු වරණීය ගිවිසුම (SAPTA) අනුව දකුණු ආසියානු රටවල් අතර ක්‍රියාත්මක වූ වරණීය රේගු බදු ක්‍රම ඔස්සේ යම් ප්‍රමාණයක වෙළෙඳ ප්‍රසාරණයක් ඇති කොට ගතහැකි වී ය. 1998 දී ඇති කොට ගන්නා ලද ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (FTA) 2000 දී ක්‍රියාවට නංවනු ලැබිණි. මෙම ගිවිසුම ක්‍රියාත්මක වීමට ද කලින් නිදහස් වෙළෙඳාමක ලක්ෂණ ඉස්මතු වන්නට පටන් ගත් බැවින් රේගු බදු සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණේ ය.

2001 වර්ෂයේ දී එ.ජ.ඩො.මිලියන 671.6 ක් ලෙස දැක්වුණු සමස්ත ඉන්දු-ශ්‍රී ලංකා වෙළෙඳාම (අපනයන හා ආනයන දෙඅංශයම) 2007 වර්ෂය වන විට එ.ජ.ඩො.මිලියන 3,265.2 ක් දක්වා ඉහළ ගියේ ය. (1 වැනි රූපය) අපනයන පරිමාණයන් ඉහළ ගියේ ආනයනයන්ට වඩා අඩු වේගයකිනි. 2001 වර්ෂයේ දී එ.ජ.ඩො.මිලියන 531 ක්ව තුබුණු ද්විපාර්ශ්වික වෙළෙඳ ශේෂය 2007 වන විට එ.ජ.ඩො.මිලියන 2234 ක් බවට පත් වුයේ ඉන්දියාවට වාසිදායක වන ආකාරයෙනි. එසේ වුව ද 2001-2005 වකවානුව තුළ දී ඉන්දියාව වෙත කරන ලද ශ්‍රී ලංකාවේ අපනයනයන් ආනයනයන් ඉක්මවන වේගයකින් වර්ධනය වූයේ ය. (2 වැනි රූපය) ඛනිජ තෙල් ආනයනයන් ඉහළ යාම මෙන් ම වනස්පති සහ තඹ අපනයනයන් ගේ පහත වැටීම ද හේතු කොටගෙන 2006-2007 වකවානුව තුළ දී මෙම හිඟය වැඩි වූයේ ය.


1 වැනි රූපය : 2001-2007 වකවානුව තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳාම



මුලාශ්‍රය: ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව

2000 න් පසුව ඉන්දියාව වෙත කැරෙන අපනයනයන් හි විවිධාංග ඇතුළත් වීමට ද පටන් ගත්තේ ය. 2007 වන විට, පරිවරණික රැහැන් ඇතුළු අනෙකුත් රැහැන් වර්ග ද, එළවළු මේදය සහ තෙල් ද, පාෂණමය නිමැවුම් ද, ප්ලාස්ටර් ද, සිමෙන්ති ද, රබර් සහ රබර් නිෂ්පාදිතයන් ද ඉන්දියාව වෙත යැවෙන ප්‍රධාන භාණ්ඩ අතර ඇතුළත් වී තිබිණි. මෙවැනි ප්‍රසාරණයන් සීමා වී පැවැතුණේ කලින් ක්‍රියාත්මක වුණු රේගු බදු හා සලාක සීමාවන් වැනි බාධාවන් හි ප්‍රතිඵලයක් වශයෙනි. පරිපූර්ණ ආර්ථික හවුල් ගිවිසුම (Comprehecive Economic partnership Agreement) හෙවත් (CEPA) ගිවිසුම පිළිබඳ කතිකාවන් තුළ දී මෙකී ගැටලු සැලකිල්ලට භාජන වී තිබේ. සීපා වැනි ගිවිසුමක් ඇති නොවිණි නම් ද්විපාර්ශ්වික ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් ශ්‍රී ලංකාවට නොලැබී යාමට ද ඉඩ තිබිණි.

2 වැනි රූපය : අපනයන හා ආනයන වර්ධනය
ප්‍රතිශතයේ වාර්ෂික වෙනස්වීම්




මුලාශ්‍රය: ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව

ඉන්දියාවෙන් කැරෙන ආනයනයන් හි සිදු වූ ශීඝ්‍ර වර්ධනය නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ම ප්‍රතිඵලයක් නොවේ. එම ගිවිසුමට පෙර සිටම ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙතින් භාණ්ඩ ආනයනය කරනු ලැබිණි. නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් පසුව ද මොටෝ වාහන, ඛනිජ තෙල් නිෂ්පාදන, කෘෂිකාර්මික නිෂ්පාදන සහ කඩදාසි වර්ග වැනි සෘණාත්මක පැත්තෙහි පැවැති භාණ්ඩ ආනයනය වර්ධනය වුයේ සාමාන්‍ය වෙළෙඳ තත්ත්වයන් යටතේ ය. ශ්‍රී ලංකාවෙහි වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන්නේ, නිදහස් වෙළෙඳ ගිවිසුම අනුව කෙරෙන ආනයන ප්‍රමාණය 2007 දී ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් කළ සමස්ත අනයනයන් ගෙන් සියයට 14 ක් පමණක් වන බව ය. නිදහස් වෙළෙඳ ගිවිසුමකින් තොරව වුව ද ඉන්දියාවෙන් කැරෙන ආනයනයන් හි වර්ධනයක් සිදු විය හැකිව තුබුණු බව මෙයින් පෙනේ.

### ආයෝජන

විශේෂයෙන් ම 2000 වර්ෂයෙන් පසුව කාලයේ දී ඉන්දියානු සෘජු විදේශීය ආයෝජන (FDI) සඳහා ආකර්ෂණීය දේශයක් බවට ශ්‍රී ලංකාව පත් වී තිබේ. ශ්‍රී ලංකා රුපියල් බිලියන 331.2 ක් වූ ශ්‍රී ලංකාවෙහි සමස්ත සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණයෙන් සියයට 6.5 ක් 2007 වර්ෂය වන විට ඉන්දියාව සතු ආයෝජනයන් වූ අතර ශ්‍රී ලංකාව තුළ ආයෝජනයන් හි යෙදුණු මුල් පෙළේ රටවල් පහට ඉන්දියාව ද ඇතුළත් වුයේ ය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දක්වන ආකාරයට සාක් රටවල් තුළ ඉන්දියාව විසින් කරනු ලැබ තිබෙන ආයෝජනයන් ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් සිදු කරනු ලැබ තිබෙන්නේ ශ්‍රී ලංකාවෙහි ය.

3 වැනි රූපය : ශ්‍රී ලංකාව තුළ ආයෝජනයන් හි යොදන
සෘජු විදේශීය ආයෝජකයන් අතර මුල් පෙළේ රටවල් පහ



මුලාශ්‍රය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය


2000 වර්ෂයෙන් පසුව එළැඹියේ ද බෙහෙවින් වැදගත් සමයකි. 2001-2007 අතර කාලය තුළ වූ සමස්ත විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහයන් ගෙන් සියයට 16 ක් සේ ගත හැකි එ.ජ.ඩො.මිලියන 33 ක පමණ ප්‍රමාණයක සාමාන්‍යයකින් ඉන්දියාවෙන් පැමිණි ආයෝජනයන් වාර්ෂිකව වැඩි වී ඇති බැවිනි.

1978 න් මෙපිට ශ්‍රී ලංකාව තුළ ද 1991 න් මෙපිට ඉන්දියාවෙහි ද සිදු කරන ලද ප්‍රතිපත්තිමය සංශෝධනයන් විසින් ද්විපාර්ශ්වික වෙළෙඳ හා ආයෝජන ප්‍රවාහයන් සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරනු ලැබිණි. ඉන්දියානු සෘජු ආයෝජනන් හි ඇති වුණු වැඩි වීමට නිදහස් වෙළෙඳ ගිවිසුම යම් ප්‍රමාණයකින් හේතු වුයේ ය. දෙරට අතර භාණ්ඩ වෙළෙඳාමෙහි ප්‍රසාරණයන් සඳහා අවශ්‍ය පරාසය එමගින් පුළුල් කර දෙනු ලැබූ අතර එහි ප්‍රතිපත්තියක් වශයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික වෙළෙඳාම තුළින් වාසි අත් කරගත හැකි වන පරිදි ආයෝජනයන් ඉහළ නැංවීමට අවශ්‍ය පරිසරය ද පුළුල් වූයේ ය. මේ අතර ආයෝජන ප්‍රවර්ධනය අරමුණු කරගනිමින්, ද්විපාර්ශ්වික ආයෝජන ප්‍රවර්ධන සහ ආරක්ෂණ ගිවිසුමකට (IPPA) ද 1997 දී ශ්‍රී ලංකාව ඉන්දියාව සමඟ එළැඹ සිටියා ය.

2003 වන විට කඩිනමින් පෙරට එමින් තුබුණු සීපා ගිවිසුම සඳහා දෙරට ම සැදී පැහැදී සිටියහ. ද්විපාර්ශ්වික ආර්ථික ඒකාබද්ධතා ක්‍රියාවලිය සේවා වෙළෙඳාම ද ආයෝජනයන් ද ඇතුළත් වන පරිදි පුළුල් කරනු ලැබිය යුතුව තිබිණි. එහෙත්, එබඳු ගිවිසුමකින් තොරව පවා ද්විපාර්ශ්වික ගිවිසුම් සහ අදාළ කතිකාවන් හේතු කොගෙන පුළුල් වී තුබුණු ශ්‍රී ලංකාවෙහි වෙළෙඳ කටයුතු සම්භාරය නිසා ශ්‍රී ලංකාව තුළ සිදු කැරුණු ඉන්දියානු විදේශීය සෘජු ආයෝජන ද වර්ධනය වූ බව දක්නට තිබේ.

ශ්‍රී ලංකා රුපියල් මිලියන 177 ක පමණ ආයෝජනයක් මත ඉන්දියානු ව්‍යාපෘතීන් 12 ක් පමණක් ක්‍රියාත්මකව පැවැති 1990 දශකය සමඟ මෙම තත්ත්වය සංසන්දනය කර බලමු. 2007 අවසාන වන විට ව්‍යාපෘතීන් 90 ක් යටතේ ඉන්දියානු විදේශීය සෘජු ආයෝජනයන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 20 ක් (දේශීය දායකත්වය රහිතව) ඉක්මවන තත්ත්වයක් දක්වා ඉහළ නැඟ තිබිණි.

4 වැනි රූපය : 1993-2009 වකවානුව තුළ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට පැමිණි වි.සෘ.ආ. ප්‍රමාණයෙහි සමුච්චිත වර්ධනය




2000 න් පසු එළැඹි යුගයේ දී ඉන්දියානු විදේශීය සෘජු ආයෝජනයන් ආර්ථිකයෙහි ඒ ඒ අංශයන් වෙත බෙදී යාමේ රටාවෙහි කැපී පෙනෙන වෙනස්කම් ඇති වන්නට වුයේ ය. ඉන්දියානු විදේශීය සෘජු ආයෝජනයන් වර්තමානයේ දී බහුල වශයෙන් යෙදැවී තිබෙන්නේ සේවා අංශය තුළ ය. (සමස්තයෙන් සියයට 63 කි.) 2000 වර්ෂයේ දී සේවා අංශයේ ප්‍රතිශතය වුයේ සියයට 30 ක් පමණි. මෙම වෙනසට හේතු වුයේ සෞඛ්‍යය, අධ්‍යාපනය, ඉන්ධන බෙදා හැරීම, හෝටල් හා සංචාරක ව්‍යාපාරය, තොරතුරු තාක්ෂණ පුහුණුව, පරිගණක මෘදුකාංග සහ වෘත්තික සේවාවන් ආදී වූ සේවාමය අංශයන්හි ලා කැරුණු ඉන්දියානු ආයෝජනයන්හි ශීඝ්‍ර ඉහළ යාම ය.

2007 වන විට සේවා අංශයට අමතරව ලෝහ ආශ්‍රිත නිමැවුම් සහ ආහාර ද්‍රව්‍ය කර්මාන්තයන් දක්වා ද ඉන්දියානු ආයෝජනයන් පුළුල් වූයේ ය. ඉන්දියාව වෙත අපනයනය කිරීම පිණිස ශ්‍රී ලංකාව තුළ කැරෙන නිෂ්පාදනයන් හි යෙදීමේ අවස්ථාව ද නිදහස් වෙළෙඳ ගිවිසුම විසින් ඉන්දියානු ආයෝජකයන් වෙත උදා කර දෙන ලදී. ඉන්දියානු දේශීය නිෂ්පාදිතයන් හා තරග කළ හැකි වන සේ වනස්පති හා තඹ අපනයනයන් ශීඝ්‍ර ලෙස වර්ධනය වීම මෙයට එක් උදාහරණයකි. ඉන්දියාව තුළින් මතු වූ දේශීය බලපෑම් හේතු කොටගෙන මෙකී අපනයනයන් සඳහා පසු කාලයේ දී සීමා පැනැවිණි.

අදාළ විෂය සඳහා වූ විධිමත් ආයතනයක් ඉන්දියාව තුළ නොමැති වීම හේතු කොටගෙන නිවැරදි දත්ත ඉදිරිත් කිරීම අපහසු වුව ද ශ්‍රී ලාංකීය ආයතනයන් විසින් ඉන්දියාව තුළ ද ආයෝජනයන් සිදු කරනු ලැබ තිබෙන බව කිව යුතු ය. ගෘහභාණ්ඩ හා ආහාර කර්මාන්තයේ ද හෝටල් ව්‍යාපාරය තුළ ද කරනු ලැබ තිබෙන එවැනි ආයෝජනයන් වාර්තාගතව ඇති තොරතුරුවල අන්තර්ගතය.

**සේවාමය වෙළෙඳාම**

ද්විපාර්ශ්වික සංචාරක ප්‍රවාහයන්

එක්සත් රාජධානිය, ජර්මනිය, මාල දිවයින සහ ඕස්ට්‍රේලියාව යන රටවල් ද අභිබවමින් ශ්‍රී ලංකාවෙහි විශාලතම සංචාරක වෙළෙඳපොළ බවට පත් වී තිබෙන්නේ ඉන්දියාවයි. (3 වැනි වගුව) 2002-2007 කාලය තුළ 20.9 ක ප්‍රතිශතයකින් (CAGR) ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දියානු සංචාරකයන් ගේ ප්‍රමාණය වාර්ෂිකව ඉහළ ගොස් තිබේ. ආරක්ෂාව පිළිබඳ වූ සංජානනයන් (පරිසරය නිරීක්ෂණය කිරීමෙන් ගොඩනගනු ලබන ආකල්ප හෝ අවබෝධයන් - perception) හේතු කොටගෙන බටහිර රටවලින් එන සංචාරකයන් ගේ ප්‍රමාණය වැඩි වී ඇත්තේ හෙමිනි.

ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කරන ලද ඒක පාර්ශ්වීය වීසා ලිහිල්කරණය ද ඇතුළු ද්විපාර්ශ්වික සම්බන්ධතාවන් හි සිදු වී තිබෙන වැඩි දියුණු වීම් ඉන්දියානු ආගමනයන් ගේ වර්ධනයට දායක වී තිබේ.

3 වැනි වගුව : මෙරටට සංචාරකයන් එන ප්‍රමුඛ රටවල් පහ

| රට | සංචාරක සංඛ්‍යාව | එකතුවෙහි ප්‍රතිශතය (%) | 2002-2007 CAGR |
|---|---|---|---|
| ඉන්දියාව | 106,07 | 21.5 | 20.9 |
| එ.රාජධානිය | 94,060 | 19.0 | 5.6 |
| ජර්මනිය | 32,042 | 7.1 | -8.7 |
| මාලදිවයින | 29,539 | 6.0 | 21.9 |
| ඕස්ට්‍රේලියාව | 20,241 | 4.1 | 9.9 |
| එකතුව | 494,008 | 100 | 6.6 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය පිළිබඳ වාර්ෂික සංඛ්‍යාමය තොරතුරු වාර්තාව 2007

4 වැනි වගුව : ඉන්දියාවෙහි ප්‍රමුඛතම සංචාරක වෙළෙඳපොළවල් පහ - 2006

| රට | සංචාරක සංඛ්‍යාව | එකතුවෙහි ප්‍රතිශතය (%) | 2002-2007 CAGR |
|---|---|---|---|
| එ.රාජධානිය | 734,240 | 16.5 | 9.2 |
| අ.එ.ජනපදය | 696,739 | 15.7 | 12.3 |
| කැනඩාව | 176,567 | 4.0 | 13.2 |
| ප්‍රංශය | 175,345 | 3.9 | 9.1 |
| ශ්‍රී ලංකාව | 154,813 | 3.5 | 3.1 |
| එකතුව | 4,447,167 | 100 | 12.9 |

මූලාශ්‍රය : සංචාරක අමාත්‍යාංශය, ඉන්දියාව.

ශ්‍රී ලංකාව, ඉන්දියාවෙහි හතර වැනි විශාලතම සංචාරක වෙළෙඳපොළ වේ. (4 වැනි වගුව) වන්දනා ගමන් එහි ප්‍රධාන හේතුව බව පෙනෙන්නට තිබේ. සෑම වර්ෂයක ම ඉන්දියාව වෙත පැමිණෙන මිලියන 4.5 ක් වූ සංචාරකයන් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කල ශ්‍රී ලාංකික සංචාරකයන් ගේ සංඛ්‍යාව සියයට 3.5 ක් තරම් වූ සුළු ප්‍රමාණයකි. එහෙත් එම ප්‍රමාණය ඉක්මවීමට ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත පැමිණෙන්නන් ගේ සංඛ්‍යාව මෙතෙක් සමත් වී නැත. ඉන්දියාව තුළ සංචාරයෙහි යෙදෙන ශ්‍රී ලාංකිකයන් ගේ සංඛ්‍යාව 2001-2006 අතර කාලයේ දී ඉහළ ගොස් තිබෙන්නේ සියයට 3.6 කින් පමණි.

**වරාය සහ ගුවන් තොටුපළ සේවා**

සවිස්තර තොරතුරු ලබා ගැනීමේ හැකියාවන් සීමා වුව ද, ඉන්දු ලංකා සම්බන්ධතාවන් තව දුරටත් ශක්තිමත් වෙමින් පවත්නා තවත් බොහෝ අංශ තිබෙන බව තහවුරු වන සාධක පෙනෙන්නට තිබේ. දක්ෂිණ ආසියානු කලාපයට තිබෙන ප්‍රධාන ප්‍රති-නැව්ගත කිරීම් මධ්‍යස්ථානය වන්නේ කොළඹ වරායයි. ඉන්දියාවෙන් එන භාණ්ඩ ප්‍රති-නැව්ගත කිරීම්වලින් සියයට 70 ක් පමණ ක්‍රියාත්මක කරනු ලබන්නේ කොළඹ වරාය විසිනි. (වෙන්කත් නාරායන,2008) කොළඹ වරාය සතු සාපේක්ෂ කාර්යක්ෂමතාව විසින් කොළඹ දී ප්‍රති-නැව්ගතකරණයන් පිරිවැය සහ කාල සාඵල්‍යතා සහිත කාර්යයක් බවට පත් කරනු ලැබ තිබේ.

ගමන් අවලංගු කිරීම් හා තවත් ගැටලු මෑතක දී දක්නට ලැබුණු නමුදු, ඉන්දියාවට යනෙන විශාලතම විදේශීය ගුවන් සේවය වන්නේ ශ්‍රී ලංකන් ගුවන් සේවයයි. බහුතරය ඉන්දියානුවන් වන එහි ගමන් ගන්නා මගීන් ප්‍රමාණය සීපා ගිවිසුමට අනුව වෙළෙඳපොළ නිදහස් කරනු ලැබීමත් සමඟ සියයට 46 දක්වා වැඩි වුයේ ය. 2003-04 සමයේ දී එම ප්‍රතිශතය දැක්වුණේ සියයට 28 ක් ලෙස ය. (ට්‍රේඩ් ඇරබියා 2008ත සමරජීව 2006 ද බලන්න.)

**සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා**

සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා වෙළෙඳාම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සිදු වුයේ එක් පසෙකට පමණක් ක්‍රියාත්මක වන්නක් ලෙසිනි. සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන් අපේක්ෂාවෙන් ශ්‍රී ලාංකිකයෝ ඉන්දියාව වෙත ගිය නමුත් එහි ප්‍රතිවර්තන ක්‍රියාවලියක් සිදු වූයේ නැත. ශ්‍රී ලංකාව වෙත සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන් අපනයනය කිරීමේ හැකියාව ඉන්දියාවට ලැබුණේ සැපයුම් දුෂ්කරතා, අඩු පිරිවැය සහ පිහිටීමේ සමීපතාව යන සාධක හේතු කොටගෙන ය. උසස් අධ්‍යාපනය මෙන්ම වෛද්‍ය පහසුකම් ද ලබා ගැනීම සඳහා මධ්‍යම ආදායම් ලබන ශ්‍රී ලාංකිකයනට යා හැකි හොඳ ම විදේශීය රට ඉන්දියාවයි. එසේ වී තිබෙන්නේ අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාවන් හි නිරත වීමේ ඉඩ රජය විසින් පෞද්ගලික අංශයට ලබා නොදීම හේතු කොටගෙන ප්‍රමාණවත් මෙන් ම ගුණාත්මක ද වූ සේවාවන් මෙරට තුළ දී ලබා ගැනීමේ දුෂ්කරතා පැවතීම ය. සිංගප්පූරුව, යුරෝපය හා ඇ.එ.ජනපදය වැනි රටවලින් මෙම සේවාවන් ලබා ගැනීමේ ශක්තිය ධනවතුනට තිබේ.

**ශික්ෂණමය ක්‍රියාවලියක් තුළ සම්බන්ධතා හැසිරවීම**

ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සම්බන්ධතාවන් ඉකුත් දශකය තුළ දී ශීඝ්‍ර වෙනස්කම්වලට ද වර්ධනයන්ට ද භාජන වූයේ ය. ඉහළ යන වෙළෙඳ හිඟයන් සහ ඉහළයන විදේශීය සෘජු ආයෝජනයන් (මෙරටට අවාසිදායක සේ පෙනෙන) සම්බන්ධයෙන් සෘණාත්මක නිගමනයන්ට එළැඹීමේ ප්‍රවනතාවක් දක්වන්නෝ, ඉන්දියාවෙන් ආනයනය නොකිරීම නිසා අධික පිරිවැයක් දැරීමට සිදු වී ඇති බව පිළිගැනීමට අසමත් වෙති. ඉන්දියානු ආයෝජනයන් නොතුබුණේ නම් දැනට පවත්නා තත්ත්වයට වඩා විශාල වෙළෙඳ ශේෂයකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු වන්නේය.

**ද්විපාර්ශ්වීය සම්බන්ධතා තුළින් වර්ධනය**

හුදු ජනප්‍රිය වීම අරමුණු කොටගත් වාණිජවාදීන් කුමක් කීව ද, කිසියම් රටක ඇත්තේ වෙළෙඳ අතිරික්තයක් වුව ද හිඟයක් වුව ද එම රට විෂයෙහි එය යහපත් වේ ද අයහපත් වේ ද යන්න ඉඳුරා කිව නොහැකි ය. ඉහළ එකතුකල අගයක් සහිත වඩා තරගකාරී වූ ස්වකීය භාණ්ඩ නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය අඩු පිරිවැය සහිත අමුද්‍රව්‍ය ශ්‍රී ලාංකීය ආයතනයන් විසින් ඉන්දියාවෙන් ආනයනය කැරෙන්නේ නම් ද, එසේ ම වෙනත් රටවල් වෙතින් කැරෙන ඉහළ පිරිවැය සහිත ආනයනයන් වෙනුවට ඉන්දියාවෙන් කැරෙන ආනයනයන් යොදා ගත්තේ නම් ද ඇති වන්නේ යහපත් තත්ත්වයකි. එවැනි තත්ත්වයක දී ඉන්දියාව හා සමඟ පවතින හිඟ ශේෂයන් ඉහළ යමින් පැවතුන ද එරට සමඟ කැරෙන වෙළෙඳාමෙන් අයහපතක් සිදු වන්නේ නැත.

සේවා වෙළෙඳාමෙහි දී ද තත්ත්වය එසේ ම ය. ඉන්දියාව වෙත සේවා අපනයනයන් හි යෙදෙමින් ආර්ථික වර්ධනය ළඟා කර ගැනීමේ ඉඩකඩ ශ්‍රී ලංකාව හමුවෙහි විශාල වශයෙන් තිබෙන අතරම, ඉන්දියාව වෙතින් ද ආපසු සේවාවන් ආනයනය කිරීමේ අවශ්‍යතාව පිළිගත යුතු ය. එසේ ම සෞඛ්‍ය හා අධ්‍යාපන වැනි සේවාවන් අඩු පිරිවැයක් යටතේ ආනයනය කළ හැකි වීම, දේශීය වශයෙන් ඒවා ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින පහළ සහ මධ්‍යම ආදායම් ලබන ශ්‍රී ලාංකිකයනට වාසිදායක වන්නේ ය.

**නීතිමය පදනමකින් යුත් ද්විපාර්ශ්වික පාලනය**

ද්විපාර්ශ්වික සම්බන්ධතාවන් හැසිරවීම පිණිස නීතිමය පදනමකින් යුත් පාලනයක් නොමැති වීම, විශේෂයෙන් ම කුඩා රාජ්‍යයන් හමුවෙහි පවතින ගැටලුවකි. ඒ ඒ පාර්ශ්වයන් අතර බල අසමමිතිය විශාල ලෙස පවතින අවස්ථාවන් හි දී මෙන් ම නීතීන් නිවැරැදි නොවන අවස්ථාවන් හි දී වුව ද යම් නීතිමය තත්ත්වයක් යටතේ පවත්නා පාලනය දේශපාලන අරාජිකත්වයකට වඩා යහපත් ය.

ඉහළ මට්ටමේ ගිවිසුම් ලෙස පිළිගත හැකි වන්නේ තමනට උරුම වූ එක සමාන දැනුම් සම්භාරයක් ද බලයක් ද ඇතිව, කර්කශ බලපෑම්වලින් තොරව මෙන් ම ඔවුනොවුන් කෙරෙහි වූ ගෞරවයකින් ද යුතුව කැරෙන ගනුදෙනුමය සාකච්ඡාවන් ඔස්සේ, සාධාරණත්ව මූලධර්මයන් පදනම් කරගනිමින් ඒ ඒ පාර්ශ්වයන් අතර එළැඹ ගන්නා නීතිමය පදනමකින් යුත් ගිවිසුම් ය.

බහුපාර්ශ්වික හා සකලපාර්ශ්වික (කලාපීය) ප්‍රගමන වැඩ පිළිවෙළක් නොමැති අවස්ථාවක දී ශ්‍රී ලංකාවට පහසුවෙන් උදා කරගත හැකි ප්‍රායෝගිකතම විකල්පය වන්නේ ශික්ෂණමය අවශ්‍යතාවන් පෙරදැරි කරගනිමින් නීතිමය පදනමක් සහිතව ඇති කොට ගැනෙන ද්විපාර්ශ්වික ගිවිසුමකි. දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA) වැනි බහු පාර්ශ්වික ගිවිසුම් ඔස්සේ ඉදිරියට යා හැකි අවස්ථාවන් විරල වන හෙයිනි. නිදහස් වෙළෙඳ ගිවිසුම යටතට නොගැනෙන ආර්ථික සම්බන්ධතාවන් සඳහා දැනට ක්‍රියාත්මක වන්නා වූ ඉන්දු-ලංකා සේවා වෙළෙඳ ගිවිසුම බඳු බල අභිප්‍රායික ගිවිසුමකට වඩා එවැනි ගිවිසුමක් ප්‍රතිඵලදායක ය.

සේවාමය වෙළෙඳාමත්, ආයෝජනයන් සඳහා වූ ශික්ෂණ ක්‍රියාවලියත්, අර්බුද නිරාකරණ ක්‍රම වැඩි දියුණු කරනු ලැබ තිබීමත්, යෝජිත පරිපූර්ණ ආර්ථික හවුල් ගිවිසුමෙහි (CEPA) තිබෙන නව ම වූ ද වැදගත් වූ ද ලක්ෂණයන් වන්නේ ය. මෙයට විරෝධතාව මතු වී තිබෙන්නේ තමන් සම්බන්ධ නැති නව ව්‍යාපාරික අංශයන් ප්‍රාණ ඇපයට තබා ගැනීමේ උත්සාහයක යෙදෙන, භාණ්ඩ වෙළෙඳාමෙහි නිරතව සිටින්නන් වෙතින් ය. සේවාමය ආනයනයන් හි දී පහත හෙළිය හැකි තීරු බදු නැත. කළ හැකිව ත්බෙන්නේ තීරු බදු නොවන සම්බාධකයන් ඉවත් කර ලීම පමණි. එබැවින් සේවාමය වෙළෙඳාමෙහි දී ශික්ෂණ ක්‍රියාවලියක වැදගත්කම ඉමහත් ය. ශික්ෂණ ක්‍රියාවලියක් නොමැති වුවහොත් එක් එක් ගනුදෙනුව වෙන වෙන ම සාකච්ඡා කිරීමට සිදු වන්නේ ය.

ශ්‍රී ලංකාව විසින් ගත යුතුව ඇති ක්‍රියා මාර්ගය පැහැදිලි ය. සේවාමය වෙළෙඳාම සඳහා මංපෙත් පාදා ලීමත් භාණ්ඩ වෙළෙඳාම ඉදිරියට ගෙන යාමත් එසේ ම ආයෝජන ප්‍රවාහයන් සඳහා පහසුකම් සැලසීමත් අරමුණු කරගනිමින් දෙපාර්ශය ම විසින් ගනුදෙනුමය සාකච්ඡාවන්ට දැනටමත් භාජන කරනු ලැබ තිබෙන සීපා ගිවිසුම ශ්‍රී ලංකාව විසින් පිළිගත යුතුව තිබේ.

**ප්‍රතිපත්තිමය නිර්දේශයන්**

1.පහත දැක්වෙන කරුණු හේතු කොටගෙන, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගවත් කළ හැකි වන්නේ ඉන්දියාව සමඟ ද්විපාර්ශ්වික ආර්ථික සම්බන්ධතා ශක්තිමත් කරවීමටත් කළමනාකරණය කරවීමටත් පියවර ගැනීම තුළින් ය.

අ) ඉන්දියාව, මේ වන විට ලෝකයේ විශාලතම වෙළෙඳපොළවලින් එකක් හැටියට චීනයට පමණක් දෙවැනි වන දකුණු ආසියාවේ වඩාත් ම වේගයෙන් වර්ධනය වන ආර්ථිකය බවට පත් වී තිබේ.

ආ) වර්තමාන ලෝක ආර්ථික අර්බුදය හමුවේ ස්වකීය වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ විභවතා ප්‍රදර්ශනය කරන ආර්ථිකයන් අතර ඉන්දියාව ද එකකි.

ඇ) දකුණු ආසියානු කලාපය තුළ, හොඳ ම ආර්ථික හා දේශපාලන සම්බන්ධතාව පවත්වා ගෙන යනු ලැබ තිබෙන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වන හෙයින් (කෙටි කාලීන මතභේදයන් වරින්වර මතු වී ඇතත්) එය කල් පවත්නා වූත් දෙපාර්ශවයට ම වාසි දායක වූත් තත්ත්වයට පත් කර ගැනීමේ හැකියාව තිබේ.

2. පැහැදිලි ලෙස විග්‍රහිත අනුදේශයන් ගෙන් සමන්විත ආර්ථික සම්බන්ධතාවන් ශක්තිමත් කරවීමෙහි ලා හේතු වන්නා වූ ප්‍රතිපත්තිමය පරිසරයක් නිර්මාණය කරවීමෙහි සමත් නීතිමය පදනමකින් යුත් නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියක් යටතේ ඉන්දියාව සමඟ පවත්නා ආර්ථික සම්බන්ධතාවන් ශක්තිමත් කරනු ලැබිය යුතු ය.

3. ජපානය හා යුරෝපා සංගමය වැනි සුවිශාල ආර්ථිකයන් සමඟ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් සම්භාරයක් පිළිබඳ ගනුදෙනුමය සාකච්ඡාවන් හි යෙදෙමින් ද ක්‍රියාත්මක කරමින් ද සිටින ඉන්දියාව වැනි රටක් සමඟ මේ වන විටත් එකඟතාවන්ට එළැඹ තිබෙන සීපා ගිවිසුම ක්‍රියාවට නැංවීම තව දුරටත් ප්‍රමාද කිරීම හෝ ඒ පිළිබඳව යළි සාකච්ඡා කරන්නට යාම හෝ නුවණට හුරු ක්‍රියාවක් නොවන්නේ ය. නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි මුල් අවුරුදු කීපය තුළ භාණ්ඩ අපනයන කරුවන් අත් දුටු ගැටලු යමක් තුබුණේ නම් ඒවා පරීක්ෂාවට ලක් කොට විසඳුම් යෙදීම සඳහා කාල නියමයන් සහිත යාන්ත්‍රණයක් අනිවාර්යයෙන් සැකසිය යුතුව තිබේ. FTA වනාහි හුදෙක් සීපා ගිවිසුමෙහි ම එක් පරිච්ඡේදයක් පමණක් වන බව, දැනට ක්‍රියාත්මකව පවතිනා නිදහස් වෙළෙඳ ගිවිසුම (FTA) හා සම්බන්ධ මැසිවිලි නඟමින් සීපා ගිවිසුමට එරෙහි වන්නන් හට ඒත්තු ගැන්වීම අවශ්‍ය ය.

4. සීපා ගිවිසුම ක්‍රියාවට නැංවීමට පෙර ද, එසේ ම එය ක්‍රියාත්මක වන අතරතුර දී ද ගත හැකිව තිබෙන විශ්වාසය ගොඩ නැංවීමේ පියවරයන් පිළිබඳ නිර්දේශයන් එම ගිවිසුම හා සම්බන්ධ ඒකාබද්ධ අධ්‍යයන කණ්ඩායමෙහි වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලැබ තිබේ. එම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට දැන්වත් පියවර ගත යුතු ය.

## කර්තෘ ගැන...


**රෝහාන් සමරජීව, Ph.D**

ආචාර්ය රෝහාන් සමරජීව, LIRNE*asia* ආයතනයේ ප්‍රධාන විධායක වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ප්‍රජා මූලික සංවිධානය වන සර්වෝදයෙහි මෙන්ම ලංකා වාණිජ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කමිටුවෙහි සහ ලංකා මෘදුකාංග පදනමෙහි ද සේවය කරයි. ආචාර්ය රෝහාන් සමරජීව ආර්ථික ප්‍රතිසංස්කරණ, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශයයෙහි වසර 2002-2004 කාලය තුළ කණ්ඩායම් නායකයෙකු වශයෙන් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණයෙහි ලා විශේෂ කාර්ය භාරයක් ඉටු කළ අතර E - ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙහි සැලසුම් කිරීමෙහිලා ආචාර්ය රෝහාන් සමරජීවගේ දායකත්වය අතිමහත්ය. මහු විදුලි සංදේශ නියාමන කොමිසමේ 1998-1999 කාලය තුළ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වූ සේම ඉන්දු-ශ්‍රී ලංකා පරිපූර්ණ ආර්ථික සහයෝගිත ගිවිසුම (2003) සැකසීමේ අන්තර් ආණ්ඩු ඒකාබද්ධ අධ්‍යන කමිටුවට සහ වාණිජ දෙපාර්තමේන්තුවේ සේවාමය වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතිය පිළිබඳ උපදේශන කමිටුවට ද ස්වකීය දායකත්වය දී ඇත.

**ප්‍රියන්වදා හේරත්**

ප්‍රියන්වදා, කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සඳහා අවසන් වසරේ අධ්‍යාපන කටයුතු වල යෙදී සිටින ශිෂ්‍යාවකි. ඇය දැනට LIRNE*asia* ආයතනයේ ආධුනිකත්ව පුහුණු වැඩසටහනක යෙදී සිටී. මෙයට පෙර පර්යේෂණ ආධුනිකයෙකු ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ නේදන් උපදේශක සමාගමේද සේවය කරනු ලැබුයේ ජෝර්ජ් ටවුන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන වැඩසටහනක සම්බන්ධව සිටියදිය.



**"පාත්ෆයින්ඩර්" පදනම**

| | |
|---|---|
| දුරකථන අංකය | 2596281 |
| ෆැක්ස් අංකය | 2595894 |
| ඊමේල් | info@pathfinderfoundation.org |
| වෙබ් අඩවිය | www.sanvada.org |
| | www.pathfinderfoundation.org |

**සංස්කරණ සහාය: අමීරා කරීම් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.**